**තංගල්ල ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 11 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට තංගල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### (අ) ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩුව | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබූ සහ පරිත්‍යාග ලෙස ලැබී තිබූ වත්කම් 11 ක එකතු වටිනාකම වූ රු. 831,297 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සියලුම ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි |
| (ii) | සමාලෝචිත වර්ෂයේදී කර්මාන්ත ණයගිම් ප්‍රතිපාදන වෙන් කිරීමේදී රු. 1,860,515 ක් වැඩිපුර වෙන් කර තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි |
| (iii) | සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබූ පිරිවැය රු. 500,000 ක් වූ ඉඩමක් සහ ඉදිකර තිබූ රු. 120,000 ක් වූ නල ළිඳ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සියලුම ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි |
| (iv) | සමාලෝචිත වර්ෂයේදී කඩා ඉවත් කළ ප්‍රාදේශීය සභා පැරණි ගොඩනැගිල්ලේ පිරිවැය රු. 73,975 ක් අඩුවෙන් ගිණුම්වලින් ඉවත් කර තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි |
| (v) | සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කළ යුතු වියදම් වර්ග 03 ක එකතු වටිනාකම වූ රු. 78,081 ක් සඳහා ප්‍රතිපාදන වෙන් කර නොතිබුණි. | වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි |

| | | | |
|---|---|---|---|
| (vi) | සමාලෝචිත වර්ෂයේදී රන්න පොදු වැසිකිළිය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් දරා තිබූ රු. 343,782 ක් වත්කමක් ලෙස ප්‍රාග්ධනිත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි |

**(ආ) නොසැසඳූ පාලන ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු. 1,203,150 ක් වූ ගිණුම් විෂයයකට අදාළ ශේෂය හා ඊට අදාළ උපයෝගී ලේඛනයේ දැක්වෙන ශේෂය අතර රු. 200,000 ක අසමානතාවයක් විය. | වෙනස්කම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | විගණන ගාස්තු සඳහා වෙන් කළ ප්‍රතිපාදනය ප්‍රමාද දෝෂයකින් වියදම් ණයහිමි උපලේඛනයට ඇතුළත් නොකරන ලදී . |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 495,898,697 ක් වූ ගිණුම් විෂයයන් 11 ක් සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | 2019 අවසන් ගිණුම සැකසීමේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරමි . |

### 1.4 අනුකූල නොවීම

#### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ134 (1) වගන්තිය | වරිපනම් බදු තක්සේරු කර අයකර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ . | දියුණු ගම් ප්‍රදේශ ගැසට් කර ඇති අතර, දේපල තක්සේරු කිරීම සඳහා සභාවට ඉදිරිපත් කළ අවස්ථාවේදී මහා සභාවේ විරෝධතාවයක් පැනනැගුණු බැවින් ප්‍රකාශයට පත්කර ඇති දියුණු ගම් ප්‍රදේශ සඳහා මහ සභාවේ අනුමැතිය නොලැබුණි. |
| (ආ) | 2008 පෙබරවාරි 01 දිනැති අංක 1534/18 දරන ගැසට් පත්‍රය | පරිසර ආරක්ෂණ බලපත්‍රයක වලංගු කාලය වූ අවුරුදු 03 ඉක්ම වූ කර්මාන්ත 43 ක් වෙනුවෙන් පරිසර බලපත්‍ර නැවත නිකුත් කර නොතිබුණි. | රජයේ ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ . | පරිසර බලපත්‍ර නැවත අලුත් කිරීමට කර්මාන්තකරුවන් දැනුවත් කර ඇති බවත්, ඔවුන් එයට අවධානය යොමු නොකළ බවත්, බලපත්‍ර කල් ඉකුත් වී ඇති කර්මාන්ත දැනට අක්‍රීය වී ඇති නම් ඒ බව දන්වන ලෙස හා |

| | | | | |
|---|---|---|---|---|
| | | | | දැනට බලපත්‍ර අලුත් කිරීමට ඇති කර්මාන්ත සඳහා බලපත්‍ර ලබා දීමට කටයුතු කරමි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) | මුදල් රෙගුලාසි 104(1) | 2013,2016 හා සමාලෝචිත වර්ෂයේදී සභාවේ වාහන 04 කට අදාළව සිදු වූ රිය අනතුරු සම්බන්ධයෙන් ප්‍රාරම්භක පරීක්ෂණයක් සිදු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ . | වාහන 03 ක මූලික පරීක්ෂණ කටයුතු 2019 වර්ෂයේ මැයි මාසයේ සිදු කිරීමට නියමිත අතර, එක් වාහනයක මූලික පරීක්ෂණ වාර්තාව කමිටුව විසින් සභාව වෙත ලබා දී තිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 395 (ඇ) | සමාලෝචිත වර්ෂය සඳහා එක් බැංකු ජංගම ගිණුමක බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ . | ප්‍රමාද දෝෂයකින් ඉදිරිපත් කිරීමට නොහැකි වූ අතර එම ගිණුමේ බැංකු සැසඳුම් ප්‍රකාශ 2019 මැයි 10 වන දින විගණනය වෙත ඉදිරිපත් කරමි. |
| (iii | මුදල් රෙගුලාසි 396 (ඇ) | නිකුත් කර මාස 06 ඉක්මවා ඇති රු. 31,911 ක් වටිනා චෙක්පත් 14 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ . | එම චෙක්පත්වල වටිනාකම 2019 මැයි මස ආදායමට ගන්නා ලදී. |
| (iv) | මුදල් රෙගුලාසි 571 | වසර දෙක ඉක්මවූ රු. 1,185,243 ක් වටිනා විවිධ තැන්පත් ශේෂ 199 ක් සහ සියයට 10 රැඳවුම් තැන්පත් 16 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ . | තැන්පත් ශේෂ 199 හා 10% රැඳවුම් තැන්පත් 16 ක් 2019 වර්ෂයේ ආදායමට ගැනීමට කටයුතු කරමි. |
| (ඈ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහන 12 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අක්‍රීයව පවතින මීටර් වෙනුවට අලුතෙන් මීටර් සවි කරන අතර, ඉන්ධන පරීක්ෂාවන් සිදු කළ යුතු වාහනවල ඉදිරියේදී ඉන්ධන පරීක්ෂාව සිදු කිරීමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සභාව සතු පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අදාළ ආකෘති පත්‍රය අනුව ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීමට නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. |
| (ඊ) | පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/ පපාකො/ 2010/01 දරන චක්‍රලේඛයේ 05 ඡේදය සහ 06 ඡේදය | කඩ කාමර 08 ක ගිවිසුම් හා තක්සේරු වටිනාකම යාවත්කාලීන කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ගිවිසුම් යාවත්කාලීන කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින අතර, මහ සභා තීරණ අනුව ඉදිරියට වසර දෙකක කාලයක් තුළ අලුත්වැඩියා කටයුතු සිදු කිරීමෙන් පසුව කඩ කාමර බිල් කිරීම සුදුසු යැයි යෝජනාවක් සම්මත විය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම, රු. 25,642,295 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.10,770,464 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| අක්කර බදු හා ව්‍යාපාර බදු | 560,000 | 930,786 | 823,238 | 382,909 | 8,095,500 | 6,219,053 | 6,310,576 | 275,361 |
| කුලී | 4,611,000 | 6,433,930 | 6,389,672 | 1,489,282 | 11,967,900 | 8,865,155 | 9,416,195 | 1,461,184 |
| බලපත්‍ර ගාස්තු | 3,000,000 | 2,536,269 | 2,536,269 | - | 2,446,700 | 4,097,079 | 4,097,079 | - |
| වෙනත් ආදායම් | 15,500,000 | 30,183,903 | 15,620,130 | 89,625,228 | 19,554,500 | 16,055,937 | 13,514,765 | 75,187,020 |
| එකතුව | 23,671,000 | 40,084,888 | 25,369,309= | 91,497,419 | 42,064,600 | 35,237,224 | 33,338,615 | 76,923,565 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ ආදායම රු. 76,923,565 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු. 40,084,888 ක් විය. ඒ අනුව වර්ෂය තුළ රැස්කළ යුතු සමස්ථ ආදායම රු. 117,008,453 ක් වුවද, වර්ෂය තුළ රැස්කරන ලද ආදායම රු. 25,369,309 ක් වීමෙන් ආදායම් රැස්කිරීමේ ප්රගතිය සියයට 22 ක් විය. වර්ෂය අවසානයට තවදුරටත් අයවිය යුතු මුළු හිඟ ආදායම රු. 91,497,419 ක් විය. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | ආදායම් රැස්කිරීම වර්ධනය කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි |

### 2.2.3 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31දිනට ලැබිය යුතු අක්කර බදු රු 160,069 .ක් වූ අතර හිඟය අයකර ගැනීමට ප්රාදේශීය සභා පනතේ (1) 158වගන්තිය ප්රකාරව කටයුතු කර නොතිබුණි. | හිඟ අක්කර බදු අයකිරීමට කටයුතු කළ යුතුවේ. | ඉඩම් විකිණීම, කැබලි වීම හා වැරදි බිල් කිරීම ආදිය හේතුවෙන් අනවශ්ය හිඟයක් පෙන්නුම් කරන බැවින් අක්කර බදු ලේඛනය යාවත්කාලීන කර ගැනීමට කටයුතු කරමි |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31දිනට ව්යාපාර ඒකක 211කින් ව්යාපාර බදු රු . 222,840ක් අයකර ගැනීමට ප්රාදේශීය සභා පනතේ (4)150වගන්තිය ප්රකාරව කටයුතු කර නොතිබුණි. | හිඟ ව්යාපාර බදු අයකර ගත යුතුවේ. | හිඟ මුදලින් රු. 40,950 කපා හැරීමට ප්රධාන අමාත්යතුමා වෙත යොමු කර ඇති අතර, දැනට වසා ඇති කඩ කාමරවලට අදාළ රු. 21,410 ක මුදල සඳහා අවශ්ය නිර්දේශ ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. හිඟ මුදලින් රු. 9,700 ක් අයවී ඇති බව සහ ඉතිරි මුදල අයකර ගැනීමට නීතිමය ක්රියාමාර්ග ගනිමි |

**2.2.4 කුලී**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවට අයත් කඩ කාමර 50 කින් කඩ කාමර කුලී රු. 808,659 ක් අයවීමට තිබූ අතර එම හිඟ මුදල් අයකර ගැනීම සඳහා ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | හිඟ කුලී අයකර ගත යුතුවේ. | කඩ කාමර 06 ක් මුද්‍රා තබා ඇති අතර, එහි වටිනාකම රු. 370,370 ක් වේ. කඩ කාමර 04 කින් අයවිය යුතු රු. 7,200 ක් කපා හැරීමට අනුමැතිය සඳහා මහ ඇමතිතුමා වෙත යොමු කර ඇත. ඉතිරි හිඟ මුදලින් රු. 128,440 ක් අයකරගෙන ඇති අතර, තවදුරටත් අයවිය යුතු මුදල අය කිරීමට කටයුතු කරමි |
| (ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31දිනට සභාවට අයත් සතිපොළ 07 කින් පොළ බදු සහ ප්‍රමාද ගාස්තු වශයෙන් රු. 680,884 ක් අයවීමට තිබුණි. | හිඟ කුලී අයකර ගත යුතුවේ. | රු. 232,388 ක් අයකර ගෙන ඇති අතර ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා බදුකරුවන් දැනුවත් කර ඇති අතර, නීතිමය ක්‍රියාමාර්ග ගනිමි |

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු. 1,564,302 ක් හා රු. 88,060,926 ක් විය. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු වලින් රු. 402,938 ක් අයවී ඇති අතර, ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස් මගින් ප්‍රධාන ලේකම් වෙත ලිපි යොමු කරන ලදී |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්ය සාධනය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31දින වන විටත් සභාවේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබාගෙන නොතිබුණි. | පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබාගත යුතුවේ. | පරිසර බලපත්‍රය ලබා ගැනීම සඳහා ඉල්ලුම් කර ඇති අතර, පෙන්වා දී ඇති අඩුපාඩු ක්‍රමානුකූලව නිවැරදි කර අදාළ පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමට කටයුතු කරමි |
| (ii) | සභා බල ප්‍රදේශයට අයත් කසළ එකතු නොකරන ප්‍රදේශයන්හි එකතු වන කසළ ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා කසළ කළමනාකරණය පිළිබඳ වැඩසටහන් පවත්වා ජනතාවගේ දැනුම වර්ධනය කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වැඩසටහන් පවත්වා ජනතාවගේ දැනුම වර්ධනය කළ යුතුවේ. | විවිධාකාරයෙන් මහජනතාව වරින් වර දැනුවත් කර ඇති අතර, ඉදිරියේදී නොදිරන ද්‍රව්‍ය වෙනම දිනයක හා වේලාවක ලබා ගැනීම හා කුඩාවැල්ල ප්‍රදේශය ආශ්‍රිතව විශේෂ වැඩසටහන් කිරීමට කටයුතු කරමි |
| (iii) | කසළ මධ්‍යස්ථානයට සතුන් ඇතුළු වීම වැළැක් වීමට හා පොලිතීන් වැනි ද්‍රව්‍ය පරිසරය පුරා විසිරී යෑම වැළැක්වීම සඳහා කසළ මධ්‍යස්ථානය වටා දැල් වැටක් ඉදිකර නොතිබුණි. | කසළ මධ්‍යස්ථානය වටා දැල් වැටක් ඉදි කළ යුතුවේ. | වැට සකස් කිරීම සඳහා විශාල මුදලක් වැයවන බැවින්, ඉදිරිපස කොටසේ පමණක් දැල් වැට ඉදිකිරීම් කරන ලද අතර, ඉදිරියේදී ප්‍රාදේශීය සභා ප්‍රතිපාදන උපයෝගී කරගෙන අඩුපාඩු සකස් කරමි |

**(ආ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනා ගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | තිරසර සංවර්ධන අරමුණු ළඟා කරගත හැකි පරිදි 2019 – 2022 සිව් වසර තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත යෝජනා සිව් අවුරුදු සැලසුමට අන්තර්ගත කරන ලදී |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2013 වර්ෂයේ සිට 2018 වර්ෂය තෙක් ප්‍රාදේශීය සභාවේ පුස්තකාලවලින් සාමාජිකයන් රැගෙන ගිය පුස්තකාල පොත් 452 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නැවත බාරදී නොතිබුණි. | පුස්තකාල පොත් නැවත ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | පුස්තකාල මගින් බැහැරට ගොස් යලි භාරදීම ප්‍රමාද වූ පොත් ලබා ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගනිමි |
| (ආ) | ශක්‍යතා අධ්‍යයනයකින් තොරව පිරිවැය රු. 655,000 ක් වූ කළමනාකරණ තොරතුරු පද්ධති 02 ක් මිලදී ගැනීම සඳහා රු. 229,250 ක අත්තිකාරම් මුදලක් 2016 වර්ෂයේදී ගෙවා තිබුණද, එම පද්ධතීන්වල ක්‍රියාකාරීත්වය මූලික මට්ටමක පැවති අතර, ගැලපෙන පරිදි සංවර්ධනය කර ගැනීමට ද සමාලෝචිත වර්ෂය තුළදීත් කටයුතු කර නොතිබුණි. | මෙම පද්ධති ප්‍රසස්ථ ක්‍රියාකාරී මට්ටමක පවත්වාගත යුතුවේ. | මෙම පද්ධති ආයතනයට ගැලපෙන පරිදි යාවත්කාලීන කිරීම සඳහා මිලදී ගත් ආයතනය වෙත දැනුම් දී ඇති අතර, අදාළ ආයතනය පැමිණ එහි ක්‍රියාකාරීත්වය පිළිබඳව දැනුවත් කරන ලදී |
| (ඇ) | සභාව සමාලෝචිත වර්ෂයේ මාර්තු 28 දින රැස් කර තිබූ මුදලින් රු. 32,070 ක් හා ඔක්තෝබර් 30 දින රැස්කර තිබූ මුදලින් රු. 15,260 ක් සභාවේ ජංගම ගිණුමේ බැංකුගත නොකර පෞද්ගලික ගිණුම් 02 ක තැන්පත් කර තිබුණි. | නිවැරදි බැංකු ගිණුම්වල මුදල් තැන්පත් කළ යුතුවේ. | වැරදීමකින් පුද්ගල ගිණුම්වලට බැර කරන ලද රු. 32,070 ක මුදල එම පුද්ගලයාගෙන් අයකර 2019 මාර්තු 29 දින පොදු ගිණුමට බැර කර ඇති අතර රු. 15,260 ක මුදල 2019 අප්‍රේල් 10 දින පොදු ගිණුමට බැර කරන ලදී |
| (ඈ) | ප්‍රා.ස 02 .චාර්තාව අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 06වන දින රැස්කර තිබුණු රු . 82,678ක් මාසයක කාලයක් අතරදවා ගෙන 2019 ජනවාරි 03දින බැංකුගත කර තිබුණි. | අප්‍රමාදව මුදල් බැංකුගත කළ යුතුවේ. | එය ප්‍රමාද දෝෂයකින් සිදු වී ඇති අතර එවැන්නක් ඉදිරියේදී සිදු නොවීමට කටයුතු කරමි |
| (ඉ) | සභාව සතු වාහන හතරකට සිදු වූ අනතුරු සම්බන්ධයෙන් අදාළ වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන පාඩුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පරීක්ෂණ පවත්වා අදාළ මුදල් වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පාඩුව සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් කවුරුන්ද යන්න පිළිබඳ මූලික පරීක්ෂණයක් සිදු කර ඒ අනුව ඔවුන්ගෙන් අය කිරීමට කටයුතු කරමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අනුමත තනතුරු වල පැවති පුරප්පාඩු 13 ක් සම්පූර්ණ කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2019 පෙබරවාරි 01 දින පුරප්පාඩු 06 ක් සහ 2019 මාර්තු 21 දින එක් පුරප්පාඩුවක් සම්පූර්ණ කර ගෙන ඇති අතර, ඉතිරිය ඉදිරියේදී සම්පූර්ණ කර ගැනීමට කටයුතු කරමි |
| (ආ) | සභාවේ සේවකයින් 13 දෙනෙකු අනුමත රාජකාරි වලින් බැහැර රාජකාරිවල යොදවා තිබුණි. | අනුමත රාජකාරිවල යෙදවිය යුතුවේ. | ප්‍රමාණවත් රියදුරන් නොමැති නිසා වෙනත් තනතුරුවල සේවය කරන සේවකයින් දෛනික රාජකාරීවල නියුක්ත කරන අතර, පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා බඳවා ගැනීමට ගැසට් පත්‍රයේ පල කිරීමට යොමු කර ඇත. අසනීප තත්ත්වයෙන් ප්‍රතිකාර ගන්නා සේවකයින් සුළු රාජකාරි සඳහා කාර්යාලයට අනුයුක්ත කරන ලදී |
| (ඇ) | නිලධාරියෙකුගෙන් අයවිය යුතු ආපදා හා උත්සව ණය ශේෂයන් පිළිවෙලින් රු. 94,200 ක් හා රු. 1,250 ක් 2015 වර්ෂයේ සිටම අය වී නොතිබුණි. | සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සේවය අතහැර ගොස් ඇති නිලධාරියාගෙන් ණය ශේෂ අයකර ගැනීමට ලිපි යවා ඇති නමුත් ඊට ප්‍රතිචාරයක් නොමැති අතර, ණය අයකර ගැනීමට සමථ මණ්ඩලයට යොමු කිරීමට කටයුතු සිදු කරමි |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී පරිසර බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | පරිසර බලපත්‍ර ලබා ලබාගත යුතු කර්මාන්ත පිළිබඳව සමීක්ෂණයක් කළ යුතුවේ. | ඉදිරියේදී පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත සම්බන්ධව සමීක්ෂණයක් සිදු කර බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා සභා බල ප්‍රදේශයේ අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | අනවසර ඉදි කිරීම් සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කළ යුතුවේ. | ඉදි කිරීම් සම්බන්ධයෙන් සමීක්ෂණයක් කඩිනමින් සිදු කිරීම කටයුතු කරමි. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31දින වන විටත් සභාව භුක්ති විඳින ඉඩම් 38 ක, ගොඩනැගිලි 09ක සහ සභාව සතු වාහන 05 ක නීත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරා ගෙන නොතිබුණි. | වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | සභාව භුක්ති විඳිනු ලබන ඉඩම්, සංවර්ධන සභා කාලයේදී පරිත්‍යාග කරන ලද ඒවා වන අතර, ඊට අදාළ ඔප්පු හා ලේඛන බොහොමයක් භීෂණ සමයේ කාර්යාලය ගිණි තැබීමත් සමඟ විනාශ වී ඇත. ඉඩම් 08 කට අදාළ ඔප්පු සභාව සතුව පවතී. අනෙකුත් ඉඩම් පවරා ගැනීම සඳහා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ ඉල්ලීම ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කර මෙම ගැටළුව පිළිබඳව ආණ්ඩුකාරතුමන්ද දැනුවත් කරන ලදී. වාහන පවරා ගැනීමට කටයුතු කරමි. |

### 3.5.2 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතු ඩබල් කැබ් රථය හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු කැබ් රථය පිළිවෙලින් 2011හා 1996 වර්ෂවල සිට නිෂ්ක්‍රීයව පවතින අතර, ඒවා අපහරණය කිරීමට හෝ අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | නිෂ්ක්‍රීයව පවතින වත්කම් අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුවේ. | අංක 5718-53දරන කැබ් රථය ඉදිරියේදී අපහරණය කිරීමට කටයුතු කරන අතර, අංක 6507-252දරන කැබ් රථය සභාව වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමි |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ආදායම් විෂයයන් 02 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු. 77,897,107 ක් වූ අතර, එය සියයට 29 සිට සියයට 89 ක් දක්වා පරාසයක විය. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවේ. | වාහන අළුත්වැඩියාව නිසා මාස ගණනක්ම අපේක්ෂිත ආදායම නොලැබීම සහ මධ්‍යම රජයෙන් හා පළාත් සභාවෙන් අපේක්ෂිත ප්‍රාග්ධන ආධාර නොලැබීම විචලනයට හේතු විය |
| (ආ) | වියදම් විෂයයන් 04 ක එකතුව රු. 60,657,903 ක් වූ ඉතිරිවීම් පැවැති අතර එය සියයට 21 සිට සියයට 100 ක පරාසයක විය. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවේ. | මන්ත්‍රී දීමනා, දුම්රිය බලපත්‍ර ගාස්තු වෙන් කිරීම් හා ප්‍රාග්ධන වියදම් වල ඉතිරිවීම් මීට හේතු විය |
| (ඇ) | වියදම් විෂයයක අහිතකර විචලනය රු .2,096,494 ක් වූ අතර එය සියයට 27 ක් විය . | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවේ. | සැපයුම් හා උපකරණ වියදම වැඩි වීම හේතු විය |